# නර්තනය

## 8 ශ්‍රේණිය දෙවන වාරය
## කැලණිය අධ්‍යාපන කලාපය




E.M.K.ප්‍රියංකා චාන්දනී මිය

ගුරු උපදේශක (නර්තන)

වත්තල කොට්ඨාසය

## 1.4 සවරං නැටුම පිළිබඳ හැඳින්වීම



සවරං නැටුම දේශීය ගැමි නැටුම් අතර විනෝදාස්වාදය අරමුණු කොට ගෙන නිර්මාණය වූවකි. 'සවරම' නම් වූ උපකරණයක් දෑතට ගනිමින් සාමූහික ව රංගනයේ යෙදේ. එහි විශේෂත්වය වන්නේ සවරම් ලීය (අලංකාර කරන ලද ලීය) ඇඟිලි අතරෙහි රඳවා ගෙන ලීය දෙපසෙහි ඇති සවරම් රැළි විසිරී යන ආකාරයෙන් කරකවමින් විවිධ රටා හැඩ මතු කරමින් නර්තනයේ යෙදීම යි.

සවරම අඟල් 2ක් පමණ රවුම් අඟල් 18ක් පමණ දිග ලී දණ්ඩක දෙපසින් එල්ලා වැටෙන සේ රැළි යොදා සකස් කර ගත් උපකරණයකි. සවරං පොලුවල දෙපසෙහි සවරම් රැළි යොදා සකස් කර ඇති නිසා ලීයෙහි මැදින් අල්ලා ගෙන චලන දක්වීම මෙහි සුවිශේෂ ලක්ෂණයකි.

සවරං නැටුමක් නිර්මාණයේ දී

- සවරම් හරි මැදින් දෑතෙහි ඇඟිලි කරු අතර රඳවා ගෙන නර්තනය කරනු ලැබේ.
- සවරම් ලී එකිනෙක ගැටීමක් සිදු නොකරයි.
- විවිධ වේග අනුව නර්තනය කළ හැකි ය.
- අතෙහි මැණික් කටුව අසලින් කරකවමින් සවරමේ රැළි විසිරී යන පරිදි
  - දෙපසට හා ඉහළ පහළ යන සේ චලනය කිරීම
  - තම බඳ වටා සවරම් වට කරකවමින් නැටීම.
  - විවිධ හැඩ තල මතුවන අයුරින් එකිනෙකා අතර සහසම්බන්ධය පවත්වා ගැනීම (සවරම මඟින්)
- යුගල වශයෙන් නර්තනය කරන විට සවරම් මාරු කිරීම ද ඉහළ දමා ඇල්ලීම ද කළ හැකි ය.
- ගායනයට/බෙර පදවලට අනුව සුදුසු චලන යොදා ගත යුතු ය.
- කණ්ඩායමක් වශයෙන් නර්තනය කරන විට එකිනෙකාගේ සවරං එකිනෙක නොගැටෙන අයුරින් නර්තනය කළ යුතු නිසා අවකාශ භාවිතය පිළිබඳ අවධානය යොමු කළ යුතු ය.
- රටා හැඩතල යොදා ගනිමින් තනිව හෝ යුගල වශයෙන් හෝ කණ්ඩායමක් වශයෙන් හෝ චලන ගොඩනඟා ගත හැකි ය.
- කණ්ඩායම් සහයෝගයෙන් යුතු ව සුදුසු පද යොදා ගනිමින් ගායනයට හා වාදනයට අනුව අභ්‍යාස කිරීම මඟින් ප්‍රාසංගික නර්තන අංගයක් නිර්මාණය කර ගත හැකි ය.

## ක්‍රියාකාරකම 1

- පහත සඳහන් වාක්‍ය සත්‍ය නම් (ස) අකුරද අසත්‍ය නම් ( අ) අකුරද වරහන් තුළ ලියන්න .

1. සවරං නර්තනයේදී, ලී පොලු එකිනෙක ගැටීම මෙහිදී දැකිය හැකි විශේෂ ලක්ෂණයකි ( )
2. මෙම නර්තනය සාමූහික නර්තන අංගයක් වේ.( )
3. සවරං ශාස්ත්‍රීය නර්තනයකි.( )
4. මෙම නර්තනය අලංකාරවීම සඳහා පොදු අවකාශ භාවිතය වඩා වැදගත් වේ.( )
5. රජුට පවන් සැලීම මුල් කර ගෙන මෙම නර්තනය නිර්මාණය වී ඇත.( )

### 3.1 සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ

**පහතරට බෙරය**



පහතරට නර්තන සම්ප්‍රදායයේ ප්‍රධාන වාද්‍ය භාණ්ඩය පහතරට බෙරයයි. යක් බෙරය, රුහුණු බෙරය, දෙවොල් බෙරය, දික් බෙරය, ඝෝෂක බෙරය යන විවිධ නම්වලින් ද හැඳින්වේ. යක් තොවිල්වලට යොදා ගන්නා බැවින් යක් බෙරය ලෙසත්, දෙවොල් මඩුවට යොදා ගන්නා බැවින් දෙවොල් බෙරය ලෙසත්, රුහුණු ප්‍රදේශයේ භාවිත කරන බැවින් රුහුණු බෙරය ලෙසත්, මහා ඝෝෂාකාරී ශබ්දයක් ඇති බැවින් ඝෝෂක බෙරය ලෙසත් දිගටි ස්වරූපයෙන් ඇති බැවින් දික් බෙරය ලෙසත් මෙය හඳුන්වනු ලැබේ.

පහතරට බෙරය සකස් කිරීම සඳහා යොද ගන්නේ අරටු සහිත ශක්තිමත් ගස්වල කඳන්ය. පොල්, කිතුල්, ඇහැළ, කොහොඹ හා කොස් වැනි ශාක මේ සඳහා වඩාත් සුදුසු ය. සාම්ප්‍රදායික ක්‍රමය අනුව බෙර කඳෙහි දිග තුන් වියත් තුනඟුලකි. ඉන් අදහස් කෙරෙන්නේ වාදන ශිල්පියාගේ අතින් වියත් තුනකුත් ඇඟිලි තුනක ප්‍රමාණය යි. බෙර මුහුණතෙහි විෂ්කම්භය අඟල් 9ක් හෝ 10ක් හෝ පමණ වේ.

පහතරට බෙරයේ දෙපසට යොදන බෙර සිවිවල සුළු වශයෙන් වෙනස්කම් ඇති අතර හයි තට්ටුවට තරමක් ඝනමත් සිවියක් යොදා ගැනේ. එය බෙරයේ වම් පැත්ත ලෙසත් දකුණු පැත්ත සුරල් තට්ටුව හෙවත් පෙරළන පැත්ත ලෙස හැඳින්වේ. බීජාක්ෂර වැයීමේ දී තත්, තොං යන අක්ෂර හයි තට්ටුවෙන් ද දිත්, නං යන අක්ෂර සුරල් තට්ටුවෙන් ද වාදනය කෙරේ.

## ක්‍රියාකාරකම 2

1. පහතරට වාද්‍ය භාණ්ඩය හඳුන්වන වෙනත් නම් දෙකක් ලියන්න .

2.පහතරට බෙරයේ දිග හා විශ්කම්භය ලියා දක්වන්න.

3 . එම බෙරයේ බෙර ඇසෙහි ඇති විශේෂත්වය කුමක්ද ?

4. එම බෙරය වාදනය කරන අවස්ථා 2ක් දක්වන්න .

5 .මෙහි බීජාක්ෂර වැයීමේදී දකුණතින් වාදනය කරන අක්ෂර දක්වන්න .

6.පහතරට බෙරයේ රූප සටහනක් ඇඳ කොටස් 5 ක් නම් කරන්න .

7. පහතරට බෙරය සඳහා යොදා ගන්නා ලී වර්ග 2 ක් නම් කරන්න .

8 වෙනිවර හා වරපටි සඳහා යොදා ගන්නා හම් වර්ගය නම් කරන්න .



**7 ශ්‍රේණියේ දී උගත් තුරඟා වන්නමේ සීරුමාරුව අඩව්ව**

සීරුමාරුව -කුඳ ගජිජි ගත දොංත ගජ්ජිත් ගජිත් ජිකුඳ
කුඳ ගජිජි ගත දොංත දොං තා.

අඩව්ව - තත් තකට තක රොං තක්කඩ තක්කඩ කුඳ තකරොං
තක රොං ගජිං ජිකුඳ කිටි තකට කුංදත්
ජිකරොං.

# විධික්‍රම අනුගමනය කරමින් ප්‍රස්තාර කිරීම

තුරඟා වන්නමේ සීරුමාරුව සහ අඩව්ව

| | ^ 1 | 2 | / 1 | 2 | 3 | ^ 1 | 2 | 1 | / 2 | 3 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| සීරු මාරුව | කු | ඳ | ග | ජි | ත | ග | ත | දොං | - | ත |
| | ගජ් | - | ජිත් | - | ග | ජිං | - | ජි | කු | ඳ |
| | කු | ඳ | ග | ජි | ත | ග | ත | දොං | - | ත |
| | දොං | - | තා | | | | | | | |
| අඩව්ව | තත් | - | ත | ක | ට | ත | ක | රොං | - | - |
| | තක් | කඩ | තක් | කඩ | කුද | ත | ක | රොං | - | - |
| | ත | ක | රොං | - | ග | ජිං | - | ජි | කු | ඳ |
| | කි | ටි | ත | ක | ට | කුං | - | දත් | - | - |
| | ජි | ක | රොං | - | - | | | | | |
| ( ( ( ( | | | | | | | | | | |

<u>ක්‍රියාකාරකම 3</u>

- වඩාත් නිවැරදි පිළිතුර තෝරා යා කරන්න .

1 මාත්‍රා 2+3 දෙතිතට                    වෛරෝඩි

අයත් වේ.

2 කුද ගජිජි ගත දොංත                    කස්තිරමකි

ගජ්ජිං ගජිං ජිකුද


3 මැදුම් තනි තිතේ                    තුරඟා

4 රුද ගත ගත ගත                    මාත්‍රා 3

කුකුදත්

5 අගය වඩන කවි                    සීරුමාරුවකි

වරුණා



## 4.2 පතුරු නැටුම හා සබැඳි කවි ගායනා

පතුරු නැටුම හා සම්බන්ධව ඊට ම ආවේණික වූ කවි ගායන ව්‍යවහාරයේ පවතී. ගැමි සමාජය තුළ දක්නට තිබූ සාමූහිකත්වය ,අව්‍යාජ බව යන ගුණාංග ඇදහිලි හා විශ්වාස ද ගුරු භක්තිය ද එම කවිවල අන්තර්ගතවේ.

පතුරු නැටුමේ කවි ගායනා විවිධ නාදමාලා හා විවිධ තාල රටා අනුව ගායනා කළ හැකි ය. නිවැරදි නාද මාලාවන් අනුව ගායනය කිරීමෙන් එහි සංස්කෘතික වටිනාකම ආරක්ෂා වේ.

තාල රූපය : මාත්‍රා 4 මහ තනි තිත

සූරිය කුල ඇති හිරු දෙවියන්නේ
පෑවිය අණසක ලොව පවතින්නේ
කාරිය කරවා පහදා දෙන්නේ
පතුරු නැටීමට අවසර දෙන්නේ

ලොව සෙත් කරවන පත්තිනි සඳිනේ
සළුවක් අරගෙන සළු සලමින්නේ
වෙනසක් නොසිතා මගෙ ගුරුවරුනේ
පතුරත් අරගෙන රඟනෙමු තොසිනේ

අතුරු නැතිව සබයේ සිටිමින්නේ
මිතුරු ලෙසින් අපි පේළි සැදෙන්නේ
සතුරු වෙලා නොව දෙපිල බෙදෙන්නේ
පතුරු නටන්නට අවසර දෙන්නේ

1 <u>ක්‍රියාකාරකම 4</u>

- පහත සඳහන් වාක්‍ය හරි නම් ( ✓ ) ලකුණද වැරදි නම්( x ) ලකුණද යොදන්න .

1 පතුරු කවි ගායනා තුළින් ගැමි ඇදහිලි හා විශ්වාස බොහෝ විට ජනිත වේ.( )

2 පතුරු නර්තනය සෑමවිටම ඒකල නර්තනයක් ලෙස දක්නට ලැබේ. ( )

3 නිවැරදි නාදමාලාවන් අනුව ගායනා කිරීමෙන් පතුරු නර්තනයේ සංස්කෘතික වටිනාකම් ආරක්ෂා වේ.( )

4 " ලොව සෙත් කරවන පත්තිනි සදිනේ " ------------ මෙම කවි ගායනය මාත්‍රා 3+ 3 තනි තිතේ තාලයට ගායනා කළ හැක.( )

5 විනෝදාස්වාදය අරමුණු කරගෙන මෑතකදී නිර්මාණය වූ ගැමි නර්තනක් ලෙස හැඳින්විය හැක.( )



## 5.0 දේශීය නර්තන කලාවේ ඓතිහාසික පසුබිම

ශ්‍රී ලංකාවේ නර්තන කලාවෙහි ඓතිහාසික තොරතුරු විමර්ශනයේ දී කිසියම් ආකාරයක නර්තන සම්ප්‍රදායයක් අතීතයේ පටන් ම මෙරට පැවති බවට සාධක හඳුනාගත හැකි ය. එක් එක් අවදිවල දී විවිධ ස්වරූපයෙන් පැවතගෙන ආ නර්තනයෙහි ආරම්භය පූජනීය තත්ත්වයකින් පැවති බවට නැටුම් විලාස හා නෙළා ඇති පුරාණ දේව රූප, ගල් පුවරු ආදිය සාක්ෂ්‍ය දරයි. ඉතිහාසගත කරුණු අනාවරණය සඳහා මූලාශ්‍ර ය පාදක කර ගනියි.

පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර ය යටතේ විමසන කල්හි ''රූකම්'' ඇසුරෙන් නර්තන කලාව පැවති බවට සාධක රාශියක් හඳුනා ගත හැකි ය. නිදසුන් ලෙස,

රූකම්

- ගල් කැටයම්
- ලී කැටයම්
- සිතුවම්
- මූර්ති

| රූකම් වර්ගය | ස්ථානය | තොරතුර (සාධකය |
|---|---|---|
| 1. ගල් කැටයම් | ලෝවාමහාපාය | • ගල්ටැම් පේකඩ -ආදියෙහි බෙර වයන, කළගෙඩි කෙළියෙහි යෙදෙන උඩැක්කි වයන, තාලම්පට වයන අයදැක්වෙති. |
| | මිහින්තලේ කණ්ඨක චෛත්‍යය | • වාහල්කඩ |
| | මැදිරිගිරිය වටදාගෙය | • කණුවල උඩැක්කිය හා එකැස් බෙර දක්නට ඇත. |
| | කෑගල්ල දිස්ත්‍රික්කයේ අලවතුර ගමේ ගනේගොඩ විහාරය | • විහාර පාදමේ ශෛලමය නළඟන රූ පෙළක් ඇත. |
| | යාපහුව දළදා මාළිගය ශෛලමය සෝපාණ පන්තිය | • පාණ්ඩ්‍ය සම්ප්‍රදායයට අනුව නිර්මිත නළු රූප ගණනාවකි. බෙර වයන හා නටන රූප ඇත. භරත නැටුමේ නර්තන විලාසවලට සමාන ය. (කරණ 108න් එක් ඉරියව්වකට) මිනසකු දැතින් සිට දෙපා ඔසවා සිටින අතර බෙර වයන්නා ඊට අනුකූලව වයන ලක්ෂණයක් පෙන්නුම් කරයි. |
| | ගඩලාදෙණිය විහාර ආලින්දයේ පාදම | • නළඟන රූපාවලියක් ඇත.<br>නටන, වයන රූප මෙන් ම නළාව, උඩැක්කිය, රබාන, තාලම්පට වයන රූප ද එහි ඇතුළත් ව ඇත. |
| | බෙන්තර ගලපාත විහාරය ගල් උළුවස්ස | • බෙර වාදක රූප, පිඹින ස්ත්‍රී රූප හා උඩරට නළියකගේ රූපයක් ද දක්නට ඇත. |
| | දෙවුන්දර දේවාලයයේ ගල් උළුවස්ස (ආරම්භයේ පහත කොටස) | • වාමන රූප 2ක් තිබේ. එක් රූපයක හොරණෑ පිඹින්නකු දැකිය හැකි ය. |
| | කෑගල්ල දිස්ත්‍රික්කයේ අම්බුළුගල ටැම්පිට විහාරයේ ගල් උළුවස්ස | • නළඟන රූපයක් ඇත.<br>• ශ්‍රී පරාක්‍රමබාහු රජු විසින් කරවන ලද එහි රබාන හා හොරණෑව දැක්වෙන රූප කැටයම් කර ඇත. පුරුෂ නැටුම් වශයෙන් අනුමාන කළ හැකි සටහන් ඇත. නළු ආභරණ උඩරට නැටුම්හි අද දක්නට ලැබෙන නැටුම් විලාස සහ ආභරණ ආදියට සමානතාවක් ඇත. |

| රූකම් වර්ගය | ස්ථානය | තොරතුර (සාධකය) |
|---|---|---|
| 2. ලී කැටයම් | ඇම්බැක්ක දේවාලයය | • බාල්කයක කැටයම් කර ඇති ලී කෙළි නැටුමක්<br>• සිවුරැස් පනේලයක නිළියක මණ්ඩියට සිටින ආකාරය (භරත නැටුමේ අරමණ්ඩියට සමාන ය) |
| | ඇම්බැක්ක කතරගම දේවාලයය | • නිළියක හා බෙර වයන්නකු සමග වෙස් තට්ටුව සහිත නළුවෙක් සිටියි. |
| | කුරුණෑගල දිස්ත්‍රික්කයේ පනාපිටිය අම්බලම | • කණුවක වෙස් බැඳි නැට්ටුවකුගේ සහ නිළියකගේ රූපයක් කැටයම් කර ඇත. |
| 3. සිතුවම් | සීගිරිය | • භරත නැටුමේ දී භාවිත කෙරෙන සම්යුත, අසම්යුත හස්තමුද්‍රා රාශියක් දක්නට ලැබේ.<br>උදා : මුකුල<br>අලපද්ම<br>කපිත්ත |
| | මුල්කිරිගල | • නළඟන රූප හා භාණ්ඩ වාදනය කරන නළඟන රූප දැකිය හැකි ය.<br>උදා : පන්තේරු නැටුම |
| | පොල්වත්ත පන්සල | • රබන් සහිත විරිදුකරුවන් දෙදෙනකුගේ චිත්‍රයකි. එක් නැට්ටුවකුගේ ඇඳුම් හා නර්තන විලාසය පහතරට නර්තන විලාස හා සමාන කමක් පවතී. |

| රූකම් වර්ගය | ස්ථානය | තොරතුර (සාධකය) |
|---|---|---|
| 4. මූර්ති | මිහින්තලේ | • සිංහපොකුණු කටට උඩින් නළඟනකගේ රූපයක් තිබීම. |
| | අනුරාධපුරයේ කුට්ටම් පොකුණ | • නළඟනකගේ නර්තන විලාසයක් දන්වන ලෝකඩ රූපයක් සොයාගෙන ඇත. එය ඉතා වේගයෙන් භ්‍රමණය වන අවස්ථාවක් පෙන්වයි. |
| | දැදිගම කොටවෙහෙරේ සූතිඝර චෛත්‍ය | • ඇත් පහනේ නළඟනකගේ ලෝහමය රූපයක් ඇත. |
| | පොළොන්නරුවේ අංක 2 ශිව දේවාලයය | • ලෝකඩ නටරාජ පිළිරුවේ පාදමේ දක්වෙන කැටයම් |
| | ශිව දේවාලයය | • තාණ්ඩව නර්තනයක නියැළි ශිව දෙවියන්ගේ රූපයෙහි එකැස් බෙරය, තාලම්පට, හොරණෑව, හක්ගෙඩිය ආදී වාද්‍ය භාණ්ඩ රූකම් අන්තර්ගත ව ඇත. |

## ක්‍රියාකාරකම 6

- පහත සඳහන් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු තෝරා

යටින් ඉරක් අදින්න

1. දේශීය නර්තන කලාවේ පැරණි තොරතුරු විමසීමේදී රූකම් යටතේ ප්‍රධාන කොටස්
   (දෙකකට , තුනකට , හතරකට , පහකට )බෙදිය හැක.

2. උඩරට නර්තනයන්හි ආභරණ හා නර්තන විලාසයන්ට සමානකමක් දක්වන පුරුෂ සටහන් දක්නට ලැබෙන්නේ
   (අම්බුලුගල ටැම්පිට විහාරයේ , බෙන්තර ගලපාත විහාරයේ , යාපහුව දළදා මාළිගයේ, මැදිරිගිරියේ වටදාගෙයි රූකම්)

3.ඇම්බැක්කේ ලී කැටයම සමානකමක් දක්වන්නේ ගැමි නර්තනයන්හි (කළගෙඩි, ලී කෙලි .පතුරු, ගොයම් )

4 භරත නැටුමේදී භාවිතා කරන හස්ත මුද්‍රා රාශියක් දක්නට ලැබෙන්නේ ( ගඩලාදෙණියේ .ලෝවාමහාපායේ . මුල්කිරිගල , සීගිරියේ )

5.පොලොන්නරුවේ අංක 2 ශිව දේවාලයයෙන් ලැබුණු මූර්තිය ( නටරාජ් පිළිරුවේ කැටයම , කුට්ටම් පොකුණේ මූර්තිය , කොටවෙහෙරේ ඇත් පහනේ මූර්තිය )

### 6.3 විවිධ ජනවර්ග හා සබැඳි සංස්කෘතික උත්සව

### නවරාත්‍රි උත්සවය



## නවරාත්‍රී උත්සවය

ද්‍රවිඩ ජනයාගේ ඉතා ම උසස් හින්දු ආගමික උත්සවයක් ලෙස නවරාත්‍රී උත්සවය හැඳින්වීමට පුළුවන. පුරා ''දින 9ක්'' රාත්‍රි භාගයේ දෙවියන් වෙනුවෙන් පවත්වන හෙයින් මෙය ''නවරාත්‍රී'' උත්සවය ලෙස නම්කොට ඇත. දුර්ගා දේවියත්, ලක්ෂ්මී දේවිය හා සරස්වතී දේවිය ප්‍රධාන කොට ගෙන දින 03 බැගින් දින 09ක් මෙම උත්සවය පැවැත්වීම සිරිත යි. මෙකී දින 09ත් පසු 10 වන දිනයේ දී ද පූජාවක් පැවැත්වෙයි. එය විද්‍යා ආරම්භය ලෙස හඳුන්වන අතර අධ්‍යාපන කටයුතු ආරම්භ කිරීම සංකේතවත් කරමින් කරනු ලබන පූජාවක් ලෙස හැඳින්වීමට පුළුවන. ''විජයදසමි'' ලෙස හින්දූන් විසින් මෙම දිනය හඳුන්වනු ලැබේ. මෙහි දී අවු. 03ත් පහළ කුඩා දරුවන්ට ප්‍රථමයෙන් අකුරු කියවීම ආරම්භ
කිරීමේ චාරිත්‍රය සිදු කරනු ලැබේ. තැටියක් මතට හාල් දමා ඒ මත 'අ' අකුර ලියා එය ප්‍රථමයෙන් ඉගැන්වීම සිදු කරනු ලැබේ. ඒ අනුව අකුරු කියවීම, ලිවීම යන අධ්‍යාපන කටයුතුවල ආරම්භය සිදු කිරීම මෙම උත්සවයේ දී සිදු කරන බැව් පැහැදිලි වේ.

තව ද නවරාත්‍රී දින රාත්‍රි පූජාව පවත්වන අවස්ථාවේ ඒ ඒ කටයුතුවල නියැළෙන්නවුන් තමාට අදාළ උපකරණ අතේ තබා පූජාව පැවැත්වීම මෙහි වූ සුවිශේෂ ලක්ෂණයකි. නිදසුනක් ලෙස අධ්‍යාපනයේ නියැළෙන්නන් තම පෑන්, පැන්සල්, පොත් ආදිය රැගෙන පූජාව පැවැත්වීම පෙන්වා දිය හැකි ය.

**පැවැත්වීමට හේතු :**

- දෙවියන් පිදීම
- සශ්‍රීකත්වය හා සෞභාග්‍යය ප්‍රාර්ථනා කිරීම
- අධ්‍යාපන කටයුතු ආරම්භ කිරීම

**පවත්වන කාල වකවානුව :**

- සාමාන්‍යයෙන් මෙම උත්සවය පවත්වනු ලබන්නේ අස්වනු නෙළන කාලයේ දී ය.

**පුද ලබන දෙවිවරු :**

ප්‍රධාන ලෙස කාන්තා දෙවිවරු තිදෙනෙක් පුද ලබති. එනම්,

1. දුර්ගා දේවිය
2. ලක්ෂ්මී දේවිය
3. සරස්වතී දේවිය

**ආගමික පසුබිම :**

ඉහත නම් කරන ලද දෙවියන් මුල් කොට මෙම උත්සවය පවත්වන බැවින් මෙහි ආගමික පසුබිම මනා ව විදහා දක්වේ. ඒ අනුව ප්‍රථම දින 03 දුර්ගා දේවිය උදෙසා පුද පූජා පැවැත්වේ. දුර්ගා දේවිය මෙම උත්සවයේ දී විටෙක 'කාලි අම්මාන්'' ලෙස ද තවත් විටෙක 'පාර්වතී' දේවිය ලෙස ද පුද ලබයි. ඇය බලයට හා ශක්තියට අධිපති දේවිය බැවින් මෙකී බලය හා ශක්තිය ජනයාට ද ලබා දෙන්නට යැයි පතමින් මෙම දින 03 පූජා පවත්වනු ලැබේ.

ඊළඟ දින 03 ලක්ෂ්මී දේවිය උදෙසා පුද පූජා පැවැත්වේ. ධනයට හා සමෘද්ධියට අධිපති දේවිය ලෙස හින්දූන් විසින් සලකනු ලබන්නී ය. එබැවින් ධනය හා සමෘද්ධිය ලබා ගැනීමේ අපේක්ෂාව දැඩි කොට ගෙන මෙම දින 03 ලක්ෂ්මී දේවියට පූජා පවත්වනු ලැබේ.

අවසාන දින 03 සරස්වතී දේවිය උදෙසා පුද පූජා පවත්වනු ලැබේ. කලාවට අධිපති දේවිය සරස්වතී හෙයින් ශාස්ත්‍ර කලා දියුණුව මුදුන් පමුණුවා ගැනීම උදෙසා මෙම දින 03 පූජා පවත්වනු ලැබේ.

**චාරිත්‍ර විධි :**

- පළමු දින 03 දුර්ගා දේවියට පූජා පැවැත්වීම.
- ඊළඟ දින 03 ලක්ෂ්මී දේවියට පූජා පැවැත්වීම.
- අවසාන දින 03 සරස්වතී දේවියට පූජා පැවැත්වීම.
- 10 වන දිනයේ විජය දසමි පූජා නම් පූජාවක් පැවැත්වීම.

**නර්තන, ගායන වාදන :**

මෙයට ආවේණික වූ විශේෂ නර්තන අංග නොමැති අතර ද්‍රවිඩ ජනයාට ආවේණික වූ නර්තන සම්ප්‍රදාය භාවිත කරනු ලැබේ.

ගායනා පිළිබඳ විමසීමේ දී ''තේවාරම්'' නම් ගායනා විශේෂයක් දෙවියන් උදෙසා ගයනු ලබන බව පෙනේ. තව ද ''සකල කලා වල්ලිමාලෙයි'' නම් ගායනාවක් ද සිදු කෙරේ.

වාදනය සඳහා තවිල් බෙරය, යොදා ගන්නා අතර බිම වාඩි වී වාදනයේ යෙදේ. තව ද ස්තෝත්‍ර ගායනා සමඟ එන සුවිශේෂ පද කොටස් ද මෙහි දී වාදනය කෙරේ.

සැරසිලි :

සැරසිලි පිළිබඳ කථා කිරීමේ දී කොටස් 02ක් යටතේ තොරතුරු සෙවිය හැකි ය. ඒ අනුව පළමු කොටස වන්නේ හින්දු කෝවිල් සරසා ගැනීම යි. මෙහි දී කෝවිල්වල සැරසිල්ලක් ලෙස කෙසෙල් ගස්, කෙසෙල් කැන් ආදිය යොදා ගනු ලැබේ.

දෙවන කොටස ලෙස තම නිවෙස් සරසා ගනු ලැබේ. මෙහි දී ප්‍රධාන සැරසිල්ලක් ලෙස තට්ටු නවයකින් යුත් ආසනයක් සාදනු ලැබේ. එකී තට්ටු නවය දේව රූපවලින් හා නොයෙකුත් සෙල්ලම් බඩුවලින් අලංකාර කරගනු ලැබේ. මෙහි අවසාන තට්ටුවේ ඇට වර්ග 9ක් ගෙන ඒවා පැළවෙන්නට තබා එම පැළ වර්ග 9 තබනු ලැබේ. මෙකී තට්ටු නවය ඔවුහු ''කොලු'' ලෙස හඳුන්වති.

<u>ක්‍රියාකාරකම 7</u>

- නිවැරදි පිළිතුර තෝරා යා කරන්න .

| | |
|---|---|
| 1 .හින්දු ආගමික උත්සවයකි | සරස්වති |
| 2.දරුවන්ට අකුරු කියවීම ආරම්භ කිරීමේ අවස්ථාව | කොලු |
| 3.බලයට / ශක්තියට අධිපති දෙවියන් වල්ලිමාලෙඉ | තවිල් |
| 4.මෙහිදී ඇසෙන ගායනාවකි. | නවරාත්‍රී |
| 5. කලාවට අධිපති දෙවියන් | විජයදසම් |
| 6. කෝවිල් සැරසීම සඳහා ගනී | දුර්ගා |
| 7. වාදන භාණ්ඩයකි. | සකලකලා වල්ලිමාලෙයි |
| .8 . තට්ටු නවයකින් යුත් සැරසිල්ල | කෙසෙල් |

# ගොප් ගෙඩියක් නිර්මාණය කිරීම

දේශීය කැටයම් කලාවේ ගොක්කොළ යොදා ගනිමින් කරනු ලබන සැරසිලි අතර ගොප් ගෙඩිය සුවිශේෂ වේ. විසිතුරු ලෙස කැටයම් කපාගත් කට්ටකොළ කෙසෙල් කොටයක් වටා සවි කිරීමෙන් ගොප් ගෙඩිය නිර්මාණය කර ගත හැකි ය. ඇතැම් විට ගොප් ගෙඩිය තට්ටු කීපයක් වශයෙන් පෙනෙන ආකාරයට ද සකස් කරනු ලැබේ. එහි දී පහත කොටස පළල් වන සේත් ඉහළට යන විට පටු වන සේත් යොදා ගැනීම ශිල්පීය ක්‍රමයකි. මෙහි අලංකාරය අඩු වැඩි වන්නේ ගොප්කොළවලින් කෙරෙන කැටයම්වල ස්වරූපය අනුව ය. පහත දැක්වෙන්නේ ගොප් ගෙඩියක සමරූපයකි.

## භාවිතයට ගන්නා අවස්ථා



- උත්සව අවස්ථාවන්හි දී වේදිකා අලංකරණය සඳහා
- පිරිත් මණ්ඩප අලංකාර කිරීම සඳහා
- මංගල පෝරු අලංකරණය සඳහා

## අවශ්‍ය උපකරණ අමුද්‍රව්‍ය

- කෙසෙල් කොටයක් (අවශ්‍ය උස ප්‍රමාණය අනුව)
- ගොප් කොළ
- මුවහත් පිහියක්

## ශිල්ප ක්‍රම

අවශ්‍ය ආකාරයට කෙසෙල් කොටය සකස් කර ගත යුතු ය. තනි තට්ටුවක් නම් අඩි 1 1/2ක් පමණ උස වන සේ ද, තට්ටු දෙකකට නිර්මාණය කරන්නේ නම් අඩි 2 1/2ක් පමණ වන සේ ද, තට්ටු 3ක් නම් අඩි 3ක් පමණ වන සේ ද උස සකසා ගන්න. (මෙය සම්මත මිනුමක් නොවේ.) පොළොව මතුපිට කෙළින් තබා ගත හැකි වන සේ කෙසෙල් කොටයේ මතු පිට පතුරු ඉවත් කළ යුතු ය. තනි තට්ටුවක් වශයෙන් ගොප් ගෙඩිය නිර්මාණය කරන්නේ නම් පොළොව මතුපිට සිට අඟල් 3ක පමණ ප්‍රමාණයකට ඉහළින් රවුමට ඉරක් වැනි කෙටි කැපුමක් යොදා ගන්න. අඟල් 2ක් පමණ ප්‍රමාණයක් ඉහළට තබා ඉහළින් ද එවැනි කැපුමක් යොදා ගන්න.

7 ශ්‍රේණියේ දී උගත් කට්ට කොළ කැපීමේ ක්‍රමය වෙනත් ආකාරයට යොදා ගැනීම මෙහි දී අපේක්ෂා කෙරේ.

කට්ට කොළ කැපීම සඳහා යොදා ගත් ගොප් කොළය දෙපස අඟලක පමණ කොටසක් ඉරටය සඳහා වෙන් කිරීම අවශ්‍ය ය. කෙසෙල් කඳට සවි කරන්නේ එම ඉරට්ට නමැති කොටසෙනි. කෙසෙල් කඳට සවි කිරීමට පෙර ගොක්කොළය දිගහැර ගත යුතු ය. ඉන් පසු කෙටි හිඩැසක් ඇති වන පරිදි රවුම් ආකාරයක් මතු වන සේ කට්ට කොළ කැපීමෙන් සරල ආකාරයක ගොප් ගෙඩියක් ඔබට නිර්මාණය කර ගත හැකි ය.

ක්‍රියාකාරකම 8.

- පහත ඇති වචන උපයෝගී කර ගෙන මෙම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| |
|---|
| පිරිත් මණ්ඩප , ගොප් කොළ , පිහියක් , ගොප් ගෙඩිය , කැටයම් , කට්ටා කොළ |

1 . ගොප් කොළ යොදා ගනිමින් කරනු ලබන සැරසිලි අතර සුවිශේෂී අංගයක් ලෙස ………………….. දැක්විය හැකිය .

2 . විසිතුරු ලෙස කැටයම් කපා ගත්……………………….. මෙම නිර්මාණය සඳහා යොදා ගනී.

3 . මෙම නිර්මාණය භාවිතයට ගන්නා අවස්ථාවක් ලෙස ………

නම් කළ හැක.

4 . මෙම නිර්මාණ කිරීමේදී අවශ්‍ය උපකරණයක් ලෙස

………………………… ප්‍රයෝජනවත් වේ .

5 . මේ සඳහා ගොප් කොළවල විසිතුරු ලෙස…………

කපා ගනී .

## ක්‍රියාකාරකම 8.

- පහත ඇති වචන උපයෝගී කර ගෙන මෙම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| |
|---|
| පිරිත් මණ්ඩප , ගොප් කොළ , පිහියක් , ගොප් ගෙඩිය , කැටයම් , කට්ටා කොළ |

1 . ගොප් කොළ යොදා ගනිමින් කරනු ලබන සැරසිලි අතර සුවිශේෂී අංගයක් ලෙස ……………….. දැක්විය හැකිය .

2 . විසිතුරු ලෙස කැටයම් කපා ගත්……………………… මෙම නිර්මාණය සඳහා යොදා ගනී.

3 . මෙම නිර්මාණය භාවිතයට ගන්නා අවස්ථාවක් ලෙස ……… නම් කළ හැක.

4 . මෙම නිර්මාණ කිරීමේදී අවශ්‍ය උපකරණයක් ලෙස ………………………… ප්‍රයෝජනවත් වේ .

5 . මේ සඳහා ගොප් කොළවල විසිතුරු ලෙස………… කපා ගනී .